පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

විෂය : නර්තනය

සතිය : 4 වන සතිය

ශ්‍රේණිය : 6

සකස් කිරීම : නිල්මිණි විජේසිංහ- මාවනැල්ල අධ්‍යාපන කලාපය

## ප්‍රස්තාර කිරීමේ විධි ක්‍රම

**තාලය:-**

නර්තනයක/ ගායනයක/ වාදනයක ක්‍රියාවන්හි කාලය මැනීම තාලයයි. මෙය තාලම්පට වාදනය තුලින් මනිනු ලබයි.

**මාත්‍රා:-**

අකුරක් කියවීමට ගතවන කාලය මනිනු ලබන්නේ මාත්‍රා වලිනි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1 ∕ | 2 | 1 ∕ | 2 | 1 ∕ | 2 | 1 ∕ | 2 |
| (සු) | දු | (ර) | තු | (ක) | හ | (ම) | ල් |
| - | - | - | - | - | - | - | - |

1. ඉතිරි පදය වන "අරගෙන පන්සල්" යන්න තිත් ඉරි පේළියේ ලියා කවිය ගයන්න.
2. මෙහි රවුම්කර ඇති අකුරට අත්පොඩි ගසමින් කවිය ගායනා කරන්න.

**ආඝාතය:-**

ආඝාතය යනු තිත තැබීමයි. මෙය තාලම් පටින් වයන අතර එය

"තිත් " සහ

"තෙයි " ලෙස වයයි.

**<u>සංඥා සලකුණු</u>**

| | |
|---|---|
| තිත් | ∧ |
| තෙයි | ∕ |
| ඇදෙන අක්ෂර දැක්වීම | - - |
| නිශ්ශබ්දත්වය | + |
| අක්ෂර කැටිකර දැක්වීම | ‿ |